# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 59/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திகதி<br>Date | 13/01/2024<br>පැය 1155 | | |

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරිම.</u>**

**01. 2024.01.12 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | 33 | 180 | තඹ දඟර 01<br>ගෑස් සිලින්ඩර් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.01.12 වන දින රාත්‍රි කාලයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ පරාක්‍රම මාවත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 250 ක්** සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 03. මෙරට නිෂ්පාදිත ගිනි අවි තුනක් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරුගම්බේ කඳවුර.

2024.01.12 වන දින රාත්‍රි කාලයේදී පොතුවිල් පොලිස් වසමේ 60 කණුව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා අරුගම්බේ කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවි තුනක්** සමග සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන පොතුවිල් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22, 35 හා 36 වයස් වල පසුවන පොතුවිල් හා තමබිළුවිල් ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.

පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.